**23.** ව්‍යාපාරයක මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඇතුළත් විය යුත්තේ,
(1) නිෂ්පාදන වේගය සහ මූල්‍ය පාඩු ය.
(2) ලාභ හෝ පාඩු ය.
(3) මුළු ආදායම සහ ශුද්ධ ලාභය ය.
(4) ආදායම සහ ඉතිරි මුදල ය.
(5) මුළු වියදම සහ ශුද්ධ ලාභය ය.

**24.** කෘෂිකර්මයේ දී, ෆොසිල ඉන්ධන මගින් බලය සපයන යන්ත්‍රෝපකරණ භාවිතයෙන් ඇති වන අනියම් බලපෑමක් වන්නේ,
(1) අංශුමය පදාර්ථ වාතයට විමෝචනය කිරීමයි.
(2) ශබ්ද දූෂණයයි.
(3) පාංශු සත්ත්වයන්ට බාධා සිදු වීමයි.
(4) ගෝලීය උණුසුම් වීමයි.
(5) පසට සහ ජලයට හානිදායි රසායනික ද්‍රව්‍ය එකතු වීමයි.

**25.** ශිෂ්‍යයෙකු විසින් ලී කුඩු සහ පිදුරු මිශ්‍රණයක් භාවිත කර කොම්පෝස්ට් සෑදීමේ දී මාසයකට පසු එහි දුර්වල දිරාපත් වීමක් නිරීක්ෂණය කරන ලදී. මූලික මිශ්‍රණයෙන් ප්‍රශස්ත දිරාපත් වීමක් ලබාගැනීම සඳහා එම ශිෂ්‍යයාට ගත හැකිව තිබූ හොඳම ක්‍රියාමාර්ගය වන්නේ,
(1) මිශ්‍රණය නිරතුරුව පෙරළීම ය.
(2) මිශ්‍රණයට දැව අළු එකතු කිරීම ය.
(3) මිශ්‍රණයට ගොම එකතු කිරීම ය.
(4) මිශ්‍රණයට රොක් ෆොස්ෆේට් එකතු කිරීම ය.
(5) මිශ්‍රණය තුළ තෙත් ගතියක් පවත්වා ගැනීම ය.

**26.** ජෛව සම්පත් සැමවිටම
(1) පුනර්ජනනීය වේ. (2) ප්‍රති උත්පාදනය වේ. (3) ජීවී දෙයකි.
(4) වියෝජනය වේ. (5) ඵලදායි වේ.

**27.** පරිසර පද්ධතියක ක්‍රියාවලි කිහිපයක් පහත දැක් වේ.
A - පරාගනය
B - ජලය රඳවා ගැනීම සහ පාංශු ඛාදනය වැළැක්වීම
C - ජෛව ඉන්ධන සැපයීම
ඉහත ක්‍රියාවලි අතුරෙන්, පරිසර පද්ධතියක චක්‍රාකාර ප්‍රභව කෘත්‍යයක්/කෘත්‍යයන් වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) A සහ C පමණි.

**28.** පරිසර පද්ධති අන්වේෂණය (eco-system prospecting) සඳහා හොඳම උදාහරණය වන්නේ,
(1) කන්නෙලිය වනාන්තරයේ පරිසර සංචාරය ය.
(2) සිංහරාජ වනයේ කිතුල් ගස් මැදීම ය.
(3) වනාන්තර පස්වල කාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ය.
(4) කෘෂිකර්මය සඳහා ජාන සම්පත් ලබා දීම ය.
(5) ස්වභාවික වනාන්තරවලින් කොතලහිඹුටු ඉවත් කිරීම ය.

**29.** KDN වන සංකීර්ණයට අයත් වනාන්තර වන්නේ,
(1) නකල්ස්, දැරණියගල සහ නව්විමලේ ය.
(2) නකල්ස්, දෙල්ලව සහ නව්විමලේ ය.
(3) නකල්ස්, දෙල්ලව සහ නාකියාදෙනිය ය.
(4) කන්නෙලිය, දෙල්ලව සහ නාකියාදෙනිය ය.
(5) කන්නෙලිය, දෙදියගල සහ නාකියාදෙනිය ය.

**30.** පහත වරණ අතුරෙන් පාරිසරික සංචාරක ව්‍යාපාරයක් සඳහා විභවයක් ඇති ප්‍රභවය තෝරන්න.
(1) දැඩි සොබා රක්ෂිතයක් (strict nature reserve) තුළ ඇති දියඇල්ලක්
(2) කොළඹ නගරයේ ඇති විශාල සාප්පු සංකීර්ණයක්
(3) මහනුවර ඇති කෘෂි-කාර්මික උද්‍යානය
(4) ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ සාම්ප්‍රදායික ධීවර ප්‍රජාව
(5) රත්නපුරේ මැණික් කෞතුකාගාරය



Department of Examinations, Sri Lanka.
Department of Examinations, Sri Lanka.

**31.** ඉහළ වටිනාකමකින් යුත් දැව විශේෂවලින් සමන්විත වූ වන වගාවක පසු අවධානය (Post-care) යොමු කළ යුතු වඩාත් වැදගත් කාර්යය වන්නේ,
(1) වියළි කාලවල දී වාරි ජල සම්පාදනය කිරීම ය.
(2) වර්ෂය පුරාවට වාරි ජල සම්පාදනය කිරීම ය.
(3) වල් පැළෑටි මර්දනය සඳහා වසුන් යෙදීම ය.
(4) වැසි කාලවල දී පාර්ශ්වික අතු කප්පාදු කිරීම ය.
(5) හොඳින් හිරු එළිය ඇති විට දී පාර්ශ්වික අතු කප්පාදු කිරීම ය.

**32.** ශ්‍රී ලංකාවේ දැව සඳහා මූලික ප්‍රභවය වන්නේ,
(1) ගෙවතු ය. (2) කෘෂි වන වගා ය.
(3) රක්ෂිත වනාන්තර ය. (4) තේ වතු ය.
(5) රබර් වතු ය.

**33.** ඉහළ ගුණාත්මයකින් යුත් දැව ලබා ගැනීම සඳහා වැඩිම විභවයක් ඇති වයිරම තෝරන්න.
(1) කෝණාක්ෂ වයිරම (Diagonal grain)
(2) සෘජු වයිරම (Straight grain)
(3) සර්පිලාකාර වයිරම (Spiral grain)
(4) අන්තර්බද්ධ වයිරම (Interlock grain)
(5) තරංගාකාර වයිරම (Wavy grain)

**34.** දැව හා සම්බන්ධ පහත ප්‍රකාශ සලකන්න.
A - අරටුවට සාපේක්ෂව එලයෙහි ශක්තිය සැමවිටම අඩු වේ.
B - දැවවල වයනය තීරණය වන්නේ ශාක සෛලයේ ප්‍රමාණය සහ පැතිරීම මත ය.
C - ඝනත්වය, දැවවල ශක්තිය මැනීම සඳහා නිවැරදි පරාමිතියක් නො වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**35.** ශ්‍රී ලංකාවේ තෙත් කලාපයෙන් බහුලවම ලබාගන්නා දැව **නොවන** වන සම්පත වන්නේ,
(1) කැලෑ බිම්මල් ය. (2) කිතුල් සාරය ය. (3) වේවැල් ය.
(4) වෙනිවැල් ය. (5) වල්ලපට්ට ය.

**36.** ස්වභාවික පරිසර කළමනාකරණයේ දී ජෛව සම්පත්වල භාවිතය පෙන්වීමට වඩාත් උචිත ක්‍රියාකාරකම තෝරන්න.
(1) වර්මිකොම්පොස්ට් සෑදීම සඳහා ගැඩවිලි පණුවන් යොදා ගැනීම
(2) ආහාර අපද්‍රව්‍ය මගින් ජීව වායුව ජනනය කිරීම
(3) වනජීවීන් ඇතුළුවීම පාලනය කිරීමට ජීව වැටක් භාවිතය
(4) ඇල්ගාවන්ගෙන් ජීව ඩීසල් නිස්සාරණය කිරීම
(5) තේ වගාවන්හි සෙවන ශාක සිටුවීම

**37.** ජලජ පැළෑටි විශේෂ කිහිපයක් පහත ලැයිස්තු ගත කර ඇත.
A - ටිකියා තෘණ
B - හයිඩ්‍රිල්ලා
C - ජපන් ජබර
D - කන්කුන්
ඉහත විශේෂ අතුරෙන්, ශ්‍රී ලංකාවේ අපජල පිරිපහදු පද්ධතියක ඇති පරිණත කිරීමේ පොකුණක (Maturation pond) භාවිත වන විශේෂ වන්නේ,
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) B සහ D පමණි. (5) C සහ D පමණි.


**38.** සම්මත භූ දර්ශන ශිල්පය වන්නේ,
(1) ග්‍රාමීය භූ දර්ශන ය. (2) විකරණය කළ භූ දර්ශන ය.
(3) පාරිසරික භූ දර්ශන ය. (4) ස්වභාවික භූ දර්ශන ය.
(5) නවීන භූ දර්ශන ය.

**39.** අක්‍රිය ධීවර ආම්පන්නයකට උදාහරණයක් වන්නේ,
(1) විසි දැල (Cast net) ය. (2) තල්ලු දැල (Push net) ය.
(3) අතංගුව (Scoop net) ය. (4) හැඹිලි දැල (Purse seine) ය.
(5) කරමල් දැල (Gill net) ය.



Department of Examinations, Sri Lanka.
Department of Examinations, Sri Lanka.

**40.** මත්ස්‍ය පැටවුන් ඇත පිහිටි ජල ජීවී ගොවිපොළකට ප්‍රවාහනය කිරීමට යොදාගන්නා පොලිතීන් බෑගයක් තුළ පැවතිය යුතු ජලය හා වාතය මට්ටම් අතර වඩාත් උචිත සංයෝජනය පෙන්වන වරණය තෝරන්න.



(1) (2) (3) (4) (5)


**41.** නිවර්තන කලාපීය රටවල සුරතල් මසුන් ප්‍රවාහනයේ දී **අවම** මූලිකත්වයක් දෙනු ලබන තත්ත්වය වන්නේ,
(1) ඔක්සිජනීකෘත පොලිතීන් මලු යොදා ගැනීම ය.
(2) ඇමෝනියා අවශෝෂක යොදා ගැනීම ය.
(3) මසුන් සඳහා ආහාර සැපයීම ය.
(4) මසුන් ප්‍රවාහනය අඩු උෂ්ණත්වයක දී සිදු කිරීම ය.
(5) පරිවෘත්තීය ක්‍රියා අවම කිරීම සඳහා ප්‍රශාන්තිජනක (Tranquilizers) යොදා ගැනීම ය.

**42.** ජලජීවී පොකුණකට පෝෂක සැපයීමෙන් සති කිහිපයකට පසු පොකුණේ ජලය තද කොළ පැහැයට හැරෙනු ගොවි මහතකු විසින් නිරීක්ෂණය කරන ලදී. තත්ත්වය පාලනය කිරීම සඳහා ගොවි මහතා විසින් ගත යුතු වඩාත් උචිත පියවර වන්නේ,
(1) පොකුණ හිස්කර, වියලෙන්නට හැර, නැවත ජලය පිරවීමයි.
(2) කුඩු කරන ලද හුණුගල් පොකුණ පුරා විසුරුවා දැමීමයි.
(3) කාර්මික ගණයේ වාතකයක් (aerator) ආධාරයෙන් පොකුණ වාතනය කිරීමයි.
(4) පොකුණේ වර්ග මීටරයකට කිලෝග්‍රෑම් 1 ක් වන සේ වියළි ගොම යෙදීමයි.
(5) පොකුණේ ජලයෙන් 1/3 ක් ඉවත් කර ඊට සම ප්‍රමාණයක් අලුතෙන් ජලය එකතු කිරීමයි.

**43.** Artemia යනු
(1) කෘමියෙකි. (2) ඇනලිඩාවෙකි. (3) කබලු මත්ස්‍යයෙකි.
(4) මොලුස්කාවෙකි. (5) දළඹුවෙකි.

**44.** මත්ස්‍ය ආහාර නිපදවීමේ ක්‍රියාවලියේ දී ආහාර මිශ්‍රණය හුමාලයට නිරාවරණය කිරීම වැදගත් පියවරක් වේ. හුමාලයට නිරාවරණය කිරීමේ වැදගත්කම වන්නේ,
(1) සත්ත්ව ආහාරයෙහි විෂබීජ නැසීම ය.
(2) අන්තර්ගත කොටස් පිසීමකට භාජනය කිරීම ය.
(3) ගබඩා කාලය දීර්ඝ කිරීම ය.
(4) ආහාරයේ ජල ස්ථායිතාවය දියුණු කිරීම ය.
(5) සත්ත්ව ආහාර මිශ්‍රණය සමජාතීය බවට පත් කිරීම ය.

**45.** රූපයෙහි දක්වා ඇති ධීවර ආම්පන්නය
(1) විශාල වල්ලමක් වේ.
(2) කුඩා වල්ලමක් වේ.
(3) තෙප්පමක් වේ.
(4) පාරුවක් වේ.
(5) කට්ටුමරම් වේ.



**46.** රබර් කිරි කැපීම උදෑසන කරනු ලබන්නේ,
(1) ඉක්මනින් කැටි ගැසීමට සහාය වීම සඳහා ය.
(2) වැඩි කාලයක් ක්ෂීර කාන්දුවීමට ඉඩ හැරීම සඳහා ය.
(3) සංයුතියේ වෙනස්වීම වළක්වා ගැනීම සඳහා ය.
(4) කිරි කපන්නාගේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ය.
(5) ක්ෂීරවල දිලිසෙන පෙනුමක් වර්ධනය වීමට ඉඩ හැරීම සඳහා ය.

**47.** පයිනස් ශාකයෙන් නිස්සාරණය කරගන්නා රෙසින මගින් සිදු කරන නිෂ්පාදන වන්නේ,
(1) කඩදාසි සහ ගම් වේ. (2) ජීව අඟුරු සහ කොම්පෝස්ට් වේ.
(3) ගම් සහ ටර්පන්ටයින් වේ. (4) ටර්පන්ටයින් සහ ජීව අඟුරු වේ.
(5) ජීව අඟුරු සහ ගම් වේ.



Department of Examinations, Sri Lanka.
Department of Examinations, Sri Lanka.

**48.** යෝගට් සහ චීස් අතර ඇති ප්‍රධාන වෙනස කුමක් ද?
(1) යෝගට් පැසවීමේ නිෂ්පාදිතයක් වන නමුත් චීස් රසායනිකව කැටි ගැසුණු නිෂ්පාදනයකි.
(2) චීස් පැසවීමේ නිෂ්පාදිතයක් වන නමුත් යෝගට් පැසවන ලද නිෂ්පාදනයක් නොවේ.
(3) චීස් නිෂ්පාදනය සඳහා යෝගට් නිෂ්පාදනය කිරීමට වඩා වැඩි කාලයක් ගත වේ.
(4) යෝගට් නිෂ්පාදනය සඳහා චීස් නිෂ්පාදනය කිරීමට වඩා වැඩි කාලයක් ගත වේ.
(5) යෝගට් එළකිරි මගින් නිපදවන අතර චීස් මී කිරි වලින් නිපදවනු ලැබේ.

**49.** වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පැසවීමේ සහ පල් කිරීමේ තාක්ෂණ එකම මූලධර්මය මත පදනම් වුව ද ඒවායේ නිෂ්පාදන වෙනස් වේ.
(2) පැසවීම ආහාර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා නමුත් පල් කිරීම කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය නිෂ්පාදනයට යොදා ගැනේ.
(3) පල් කිරීමේ සහ පැසවීමේ ක්‍රියාවලි දෙකම සමාන ක්ෂුද්‍රජීවීන් මගින් සිදු කරනු ලැබේ.
(4) සියලු ම පැසවන ලද නිෂ්පාදන අධික ලෙස ආම්ලික වේ.
(5) පැසවන ලද නිෂ්පාදනවල පෝෂණ ගුණය ඒවායේ මූලික පෝෂණ අගයන් හා සමාන වේ.

**50.** දැව ඉරීමේ අපද්‍රව්‍ය ඵලදායි ලෙස කොම්පෝස්ට් බවට පත් කළ හැක්කේ, එයට
(1) ජලය එකතු කිරීම මගිනි.
(2) දැව අළු එකතු කිරීම මගිනි.
(3) ආහාර අපද්‍රව්‍ය එකතු කිරීම මගිනි.
(4) එළවළු අපද්‍රව්‍ය එකතු කිරීම මගිනි.
(5) මැටි පස් එකතු කිරීම මගිනි.

* * *

Department of Examinations, Sri Lanka.
Department of Examinations, Sri Lanka.

මේ තීරයේ කිසිවක් නො ලියන්න.

**3.** (A) ශ්‍රී ලංකාවේ මූලික වශයෙන් ස්වභාවික පරිසරයෙන් ලබාගන්නා පහත දැක්වෙන ජෛව සම්පත් කාණ්ඩවලට උදාහරණයක් බැගින් සඳහන් කරන්න.

(1) ගෘහ කර්මාන්ත සඳහා යොදා ගන්නා ශාකයක්/ගසක් : ....................................

(2) පලතුරක් : ....................................

(B) වනජ විශේෂවල ස්ථානීය සංරක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත සංරක්ෂණ කලාප **හතරක්** නම් කරන්න.

(1) ....................................

(2) ....................................

(3) ....................................

(4) ....................................

(C) පාරිසරික සංචාරක කර්මාන්තයේ සමාජ-සංස්කෘතිකමය වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) ....................................

(2) ....................................

(D) දැව අස්වනු ගැනීම සහ සැකසීම දැව සම්පත්වල තිරසාර භාවිතය තහවුරු කරන වැදගත් ක්‍රියා වේ.

(i) ශ්‍රී ලංකාවේ දැව සම්පත් කළමනාකරණය කිරීමට රාජ්‍ය දැව සංස්ථාව මගින් කරන ප්‍රධාන කාර්යයක් සඳහන් කරන්න.

....................................

(ii) ගසක පහත දැක්වෙන මිනුම් ලබාගැනීමට භාවිත වන සම්මත ආම්පන්න හෝ උපකරණ සඳහන් කරන්න.

(1) කඳෙහි විෂ්කම්භය : ....................................

(2) ගසේ උස : ....................................

(iii) පහත දැක්වෙන දැව ඉරන කියත්වල ප්‍රධාන භාවිතය නම් කරන්න.

(1) Headrig : ....................................

(2) Trimmer : ....................................

(iv) දැව වාතයේ පදම් කිරීමේ **අවාසියක්** සඳහන් කරන්න.

....................................

(E) (i) පහත දැක්වෙන ස්වභාවික වනාන්තරවලින් ඉවත් කරගන්නා ප්‍රධාන දැව **නොවන** වන සම්පත බැගින් නම් කරන්න.

(1) සවානා වනාන්තර : ....................................

(2) කඩොලාන වනාන්තර : ....................................

(ii) පාරිසරික භූ දර්ශනයක් සඳහා යොදා ගැනීමට නියමිත වෘක්ෂ විශේෂයක තිබිය යුතු වැදගත් ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ....................................

(2) ....................................



Department of Examinations, Sri Lanka.
Department of Examinations, Sri Lanka.

මෙම තීරයේ කිසිවක් නො ලියන්න.

(F) අපනයනය සඳහා සුදුසු විසිතුරු මසුන් තෝරා ගැනීමේ දී සැලකිය යුතු ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

(4) ..........

(G) වන ජීවීන්ගේ පැවැත්මට තර්ජනයක් විය හැකි අභ්‍යන්තර බලවේග **තුනක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

**4.** (A) කෘෂි වන වගාවේ වාසි **තුනක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

(B) කරදිය සහ කිවුල්දිය මත්ස්‍ය විශේෂ සඳහා අපනයන වෙළෙඳපොළෙහි වර්ධනය වන ඉල්ලුමක් ඇත. අපනයන වෙළෙඳපොළෙහි ප්‍රධාන ඉල්ලුම පවතින එවන් මත්ස්‍ය විශේෂ **දෙකක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(C) ගෝලීය වශයෙන්, ජලජීවී වගාව සඳහා සුලභ ජල ප්‍රභව යොදා ගැනේ. ශ්‍රී ලංකාවේ ජලජීවී වගාව සඳහා යොදාගෙන ඇති සුලභ ජල ප්‍රභව **හතරක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

(4) ..........

(D) ජලයේ ගුණාත්මය, ජලජීවී වගාවේ නිෂ්පාදනයට බලපාන ප්‍රධාන සාධකයක් වේ. සූක්ෂම ලෙස කළමනාකරණය කරන ජලජීවී වගා පොකුණක නිරතුරුව නිරීක්ෂණය කළ යුතු ජලයේ ගුණාත්මක පරාමිති **හතරක්** නම් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

(4) ..........

[හත්වැනි පිටුව බලන්න.

Department of Examinations, Sri Lanka.
Department of Examinations, Sri Lanka.

